**හම්බන්තොට ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 11 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | හම්බන්තොට දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකයෙන් සභාවට ලැබී තිබූ වටිනාකම රු. 63,000 ක් වූ ජල මෝටරය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි. | සියලුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී බොල්හිඳ කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ ගබඩාවක් ඉදි කිරීමේ කර්මාන්තයට අදාළව රු. 900,088 ක් අඩුවෙන් ණයහිමි ප්‍රතිපාදන ඇති කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |
| )iii( | සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී කළ ඉදිකිරීම් 07 ක් සඳහා දැරූ එකතු වටිනාකම රු. 3,327,801 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියලුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |

**(ආ) නොසැසඳූ පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයයන් 03 කට අදාළ එකතුව රු. 12,136,848 ක් වූ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/ලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු. 200,884 ක අසමානතා පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු. 85,425,637 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉඩම් පවරා ගෙන දේපල තක්සේරු කර ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නිවැරදි උපලේඛන පවත්වා ගෙන යාමට කටයුතු කරමි |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | | | |
| | (i) රීති 185 | සභාවේ ජංගම ගිණුම් 02 ක පැවති අතිරික්ත මාසික සාමාන්‍ය මුදල් ශේෂය පිළිවෙලින් රු. 1,792,156 ක් හා රු. 8,939,600 ක් වුවත් ඉන් කොටසක් හෝ ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කර්මාන්ත සඳහා සියයට 10 රැඳවුම් මුදල් ගෙවීමට ඇති නිසා ආයෝජනය කළ නොහැකි වූ අතර ඉදිරියේදී ස්ථාවර තැන්පතු ආරම්භ කිරීමට කටයුතු කරමි |
| | (ii) රීති 193 | අයවැය සමඟ අය හා වැය විෂයයන් සසඳා අතිරික්තතා හා ඌනතා වලට හේතු දැක්වෙන ප්‍රකාශනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී අයවැය විචලනයන්ට හේතු දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කර ඉදිරිපත් කරමි |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි
------------------------

| | | | |
|---|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 371(5) | වටිනාකම රු. 50,098 ක් වූ අත්තිකාරම් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | රු. 3,339 ක් පියවා ඇති අතර හඳුනා ගැනීමට නොහැකි ශේෂ කපා හැරීමට මහ සභාවේ අනුමැතිය 2019 මාර්තු 21 දින ලබා ගෙන ඇත |
| (ii) මුදල් රෙගුලාසි 571 | වසර 02 ඉක්මවූ වටිනාකම රු. 2,647,466 ක් වූ පොදු තැන්පත් ශේෂ 07 ක් සහ 10% රඳවුම් මුදල් ශේෂ 44 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 මාර්තු 21 දින පැවති මහා සභා රැස්වීමේදී රු. 66,522 ක් රාජ්‍ය ආදායමට ගැනීමටද ඉතිරිය ලිපිගොනු පරීක්ෂා කර රාජ්‍ය ආදායමට ගැනීමට තීරණය කළෙමි |
| (iii) මුදල් රෙගුලාසි 702(3) | කොන්ත්‍රාත් සම්බන්ධව අත්සන් කරනු ලබන ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ සිට අත්සන් කරන ගිවිසුම්වල පිටපත් විගණනයට ඉදිරිපත් කරමි |

**2. මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම, රු. 12,488,338 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,629,022 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

----------------------

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

-------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස් කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස් කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,988,492 | 2,631,265 | 1,833,323 | 1,304,694 | 7,224,500 | 7,753,057 | 6,919,927 | 833,131 |
| කුලී | 8,455,900 | 5,603,000 | 5,553,900 | 39,400 | 5,157,100 | 6,332,943 | 6,257,893 | 75,050 |
| බලපත්‍ර ගාස්තු | 11,813,700 | 16,644,801 | 16,559,851 | 790,080 | 1,030,600 | 1,747,778 | 1,763,328 | 710,880 |
| වෙනත් ආදායම් | 7,491,300 | 6,291,823 | 1,870,591 | 21,195,890 | 6,916,100 | 9,610,153 | 4,932,870 | 22,120,460 |
| එකතුව | 29,749,392 | 31,170,889 | 25,817,665 | 23,330,064 | 20,328,300 | 25,443,931 | 19,874,018 | 23,739,521 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු. 54,910,410 ක් වුවද, වර්ෂය තුළ රැස්කරන ලද ආදායම රු. 25,817,665 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 47 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | 2019 වර්ෂයේ දේපල තහනම් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර මුද්දර ගාස්තු, උසාවි දඩ සම්බන්ධව ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කර ලබා ගැනීමට ඉල්ලීම් කරන ලදී |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු රු. 752,669 ක් වූ අතර හිඟය අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | මෙම වර්ෂය තුළදීත් දේපල තහනම් කිරීමේ වැඩසටහනක් සංවිධානය කර අයවීමට ඇති හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කරමි |

**2.2.4** **බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී ලැබිය යුතු බලපත්‍ර ගාස්තු රු. 710,880 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම මුදල කාලාවරෝදයට හසු වී ඇති බැවින් අයකරගත නොහැකි අතර කපා හැරීම සඳහා අවශ්‍ය උපලේඛන සකස් කර විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතියට ඉදිරිපත් කරන ලදී |

**2.2.5** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 5,924,866 ක් හා රු. 15,184,214 ක් වූ අතර ඉන් වර්ෂ 05 ට වැඩි ශේෂය පිළිවෙලින් රු. 2,651,012 ක් හා රු. 7,393,853 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 පෙබරවාරි 20 දින හිඟ මුද්දර ගාස්තු සහ උසාවි දඩ පිළිවෙලින් රු. 462,461 ක් හා රු. 2,573,539 ක් අයකර ගත් අතර ඉතිරිය කඩිනමින් ලබා ගැනීමට කටයුතු කරමි |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්ය සාධනය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018වර්ෂයේ අයවැය ලේඛනයේ ඇතුළත් කර තිබූ සංවර්ධන යෝජනා 48 ක් අතුරින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට සංවර්ධන යෝජනා 06 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි . | අයවැය ලේඛනයෙහි ඇතුළත් කර ඇති සංවර්ධන යෝජනා ඉටු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර යුතුවේ. | අපේක්ෂිත වැඩසටහන් සඳහා ප්‍රතිපාදන නොලැබීම හා ව්‍යාපෘති වාර්තාවට අනුමැතිය නොලැබුණි |

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක වෙනුවෙන්ම දිගු කාලීන සැලැස්මක් සකස් කර නොමැති වුවත් අඛණ්ඩව එම කටයුතු කරමින් පවතින අතර ඉදිරියේදී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර සැලසුම් සකස් කරමි |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී පාරිසරික ආරක්ෂක බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාරික ස්ථාන සම්බන්ධව හඳුනා ගැනීමක් සිදුකර නොතිබුණු අතර බල ප්‍රදේශයේ ක්‍රියාත්මක වන කර්මාන්ත 10ක් සඳහා ද පරිසර බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | පාරිසරික ආරක්ෂක බලපත්‍ර ලබාගත යුතුවේ. | කර්මාන්ත කිහිපයකට බලපත්‍ර නිකුත් කර ඇති අතර බලපත්‍ර ලබා නොගත් කර්මාන්ත හඳුනා ගනිමින් නිරන්තර අධීක්ෂණයක යෙදෙමින් එම කර්මාන්ත බලපත්‍ර ලබා ගැනීමට යොමු කරමි |
| (ආ) | සභා බල ප්‍රදේශයේ ස්ථාපිත දුරකථන කුළුණු සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | දුරකථන කුළුණු සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කළ යුතුවේ. | වසම් කිහිපයක මෙම සමීක්ෂණය සිදුකර ඇති අතර ඉතිරි වසම්වලද ඉදිරියේදී සමීක්ෂණ කටයුතු සිදු කරමි |
| (ඇ) | නාගරික සංවර්ධන හා ප්‍රජා භූමි අමාත්‍යවරයා විසින් නිකුත් කළ 2009 අප්‍රේල් 17දිනැති අංක 8/1597දරන අති විශේෂ ගැසට් පත්‍රයේ V වන උපලේඛනයේ (5) 4උප වගන්තිය ප්‍රකාරව සෑම ඉදිකිරීමක්/සංවර්ධනයක් සඳහාම අනුකූලතා සහතිකය ලබාගත යුතු වුවත් සභා බල ප්‍රදේශයේ ස්ථාපිත විදුලි සංදේශ කුළුණු 10න් කුළුණු 06 ක් සඳහා අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි . | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අනුකූලතා සහතික ලබා ගන්නා ලෙස අදාළ ආයතන වලට ලියාපදිංචි තැපැල මගින් දැනුම් දී ඇත. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 13 ක් සම්පූර්ණ කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු සේවකයින් සම්පූර්ණ කර ගැනීම සඳහා ප්‍රධාන ලේකම් වෙත සහ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇත. එක් තනතුරක් සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කර ඇත. |
| (ආ) | සභාව විසින් බඳවා ගෙන තිබුණු සේවකයින් 09 දෙනෙකු නිත්‍ය තනතුරේ රාජකාරිවලින් බැහැර රාජකාරි සඳහා යොදවා තිබුණි. | නිලධාරීන් අනුමත රාජකාරිවල යෙදවිය යුතුවේ. | සේවක පුරප්පාඩු පවතින අතර එදිනෙදා අත්‍යාවශ්‍ය රාජකාරි සඳහා නිලධාරීන්ගෙන් දැනුම අනුව රාජකාරි ඉටු කර ගත්තෙමි. |
| (ඇ) | ස්ථාන මාරු වී ගිය හා සේවය අතහැර ගොස් සිටින සේවකයින්ගෙන් අයවිය යුතු රු. 184,360 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මෙම සියලු මුදල් අයකර ගැනීමට කටයුතු කරමි |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව භුක්ති විඳින ඉඩම් 06 ක හා ගොඩනැගිලි 10 ක අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉඩම් 03 ක් සඳහා ඔප්පුවක් හෝ වෙනත් නෛතික ලියවිල්ලක් නැති අතර, ඉඩම් සියල්ලම පවරා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම්ගෙන් ඉල්ලීම් කර ඇත. අනෙක් ඉඩම් 03 හා ගොඩනැගිලි තක්සේරු කර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කරන ලදී |
| (ආ) | රු. 720,000 ක් වටිනා කළමනාකරණ මෘදුකාංග පද්ධතිය මිලදී ගෙන වසරකට වැඩි කාලයක් ගතවී තිබුණද එකදු පරිගණක මෘදුකාංග පද්ධතියක් හෝ අරමුණුගත ක්‍රියාකාරී මට්ටමෙහි නොතිබුණි. | මෙම පද්ධති ප්‍රශස්ථ ක්‍රියාකාරී මට්ටමක පවත්වාගත යුතුවේ. | මේ වන විට පරිගණක මෘදුකාංගවලට තොරතුරු ඇතුළත් කරමින් සිටින බව හා එම පද්ධතිවලින් ප්‍රයෝජන ගැනීමට කටයුතු කරමි |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2017වර්ෂයේ ජූලි 31වන දින CCTV කැමරා 10 ක් මිලදී ගැනීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේදී නිර්දේශ ලබාගෙන 2018වර්ෂයේ අයවැයෙන් මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන වෙන් නොකර රු. 733,635 කට කැමරා 24 ක් මිලදී ගෙන තිබුණි. | නිවැරදි අයවැය කළමනාකරණයක් පවත්වා ගෙන අනුමැතිය පරිදි මිලදී ගැනීම කළ යුතුවේ. | මුලින්ම කැමරා 10 ක් සවි කිරීම සඳහා කමිටුව තීරණය කළද නව කාර්යාලයට පැමිණීමත් සමඟ එය ප්‍රමාණවත් නොවූ බැවින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු සහ විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන විදුලි ඉංජිනේරු සභාවට පැමිණ කැමරා ස්ථාපනය කිරීමට උපදෙස් ලබා දුන්නෙමි |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව භුක්ති විදින ක්‍රීඩා පිටි 07ක ,සුසාන භුමි 21ක හා ප්‍රජා ශාලා 5ක නීත්‍යානුකුල අයිතිය සමාලෝචිත වර්ෂයේදීත් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි . | වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ වන විට ඉඩම් 14 ක මැනුම් කටයුතු අවසන් කර ඇතත් සභාවට පවරා දීමට කටයුතු කර නොතිබූ අතර ඉතිරිය මැනුම් කර සභාවට පවරා ගැනීමට කටයුතු කරමි |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආදායම් විෂයයන් 02 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 3,595,945 ක් වූ අතර එය සියයට 26 සිට සියයට 34 ක් දක්වා පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ | ඩෙංගු මර්දන වැඩසටහන් සඳහා සභාවේ යන්ත්‍ර භාවිතා කිරීම නිසා යන්ත්‍ර කුලියට දීමට නොහැකි වීම හේතු විය |
| (ආ) | වියදම් විෂයයන් 06 ක එකතුව රු. 12,880,361 ක් වූ ඉතිරිවීම් පැවති අතර එය සියයට 24 සිට සියයට 62 ක් දක්වා පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ | නවක සේවකයන් බඳවා ගැනීමට ප්‍රතිපාදන ඇති කළත් එම සේවකයන් බඳවා නොගැනීම හා ඉඩම් මැනීමට වෙන් කර මුදල් වර්ෂය තුළ නොගෙවීම හේතු විය |